
## ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර බදු දීමේ ක්‍රියාවලිය



## 13.1 හැඳින්වීම

බල ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයකින් එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමට කෙරෙන පොදු උපයෝගී සේවාවක් වශයෙන් පළාත් පාලන ආයතන විසින් කඩ කාමර ඉදිකරනු ලැබේ. ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා මේ කඩ කාමරවල ව්‍යාපාර කටයුතු කිරීමේ අයිතිය ලංසු කැඳවීම මඟින් තැනැත්තන් වෙත වාර්ෂිකව හෝ දීර්ඝකාලීනව බදු දෙනු ලබන අතර එමඟින් ප්‍රාදේශීය සභාවට ආදායමක් ද උපයා ගනී.

## 13.2 නෛතික අධිකාරිය

- 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108, 19(xii), 119, 173 හා 174 යන වගන්ති
- වයඹ පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2019/02 චක්‍රලේඛය
- 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති

## 13.3 ගාස්තුව

(අ) ලංසු ඉල්ලුම්කරුවන්, ප්‍රාදේශීය සභාව විසින් අදාළ ලංසු කැඳවනු ලබන අවස්ථාවේ දී තීරණය කර ප්‍රසිද්ධ කරනු ලබන වටිනාකමින් යුක්ත වූ ආපසු නොගෙවන ලංසු ඉල්ලුම් පත්‍ර ගාස්තුවක්.

(ආ) කඩ කාමර බදු දීමේදී ලංසුකරුවන් විසින් ඉදිරිපත් වී ඇති ලංසු වටිනාකම් අතරින් සභාව විසින් පිළිගනු ලබන වාර්ෂික ලංසු වටිනාකම වාරික 12 කින් අදාළ වර්ෂය තුළදී අයකර ගත යුතු අතර මාසික කුලිය අදාළ මාසයේ 10 වන දිනට පෙර අයකර ගත යුතුය.

## 13.4 තක්සේරුව, ලංසු කැඳවීම, ඉල්ලුම්කිරීම සහ ලංසු පිරිනැමීමේ කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය/ වගකීම |
|---|---|---|---|
| 1 | සභාව විසින් පිළියෙල කරන ලද ගොඩනැගිලි සැලැස්මක් ඉදිරිපත් කර ඉදි කරන ලද කඩ කාමර, සභාව විසින් කිසියම් මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබාගෙන ඉදි කරන ලද කඩ කාමර, සභා අරමුදලෙන් හෝ යම් ආයතනයක් මඟින් කරන ප්‍රදානයක් මත ඉදිකරන කඩ කාමර තක්සේරු කිරීම. | අදාළ ගොඩනැගිලි ඉදිකර අවසන් වූ වහාම. | සභාපති/ ලේකම්/සභාවේ තාක්ෂණ නිලධාරී |
| 2 | දේපළ තක්සේරුව මත අවම ලංසුව තීරණය කිරීම හා දේපළේ අවම ලංසුව සභා සම්මත කිරීම | තක්සේරුව අවසන් වූ වහාම හා ලංසු කැඳවීමට පෙර. | සභාපති/ ලේකම් |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය/ වගකීම |
|---|---|---|---|
| 3 | I. ප්‍රාදේශීය සභා පනතේ වගන්ති අංක 16 හා 18 වන වගන්ති ප්‍රකාරව ලැබී ඇති දේපළක ඉදිකර ඇති කඩ කාමර බදු දීමට අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම.<br><br>II. ප්‍රාදේශිය සභා පනතේ වගන්ති අංක 16 හා 18 වන වගන්ති ප්‍රකාරව හැර අන් ලෙසකින් ලැබී දේපළවල ඉදිකර ඇති කඩ කාමර බදු දීමේ දී,<br>• වසර 3 කාලයක් සඳහා බදු දීමේදී බදු ගිවසුම සභා ගත කිරීම හා බදු දීමට අදාළව සභා තීරණයක් ගැනීම.<br>• වසර 3 වැඩි එහෙත් වසර 30 කාලයක් සඳහා බදු දීමේ දී ඊට අදාළ බදු කාලය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම. | ඉදිකිරීම අවසන් වූ වහාම හා ලංසු කැඳවීමට පෙර.<br><br>ඉදිකිරීම අවසන් වූ වහාම හා ලංසු කැඳවීමට පෙර. | සභාපති/ලේකම්<br><br>සභාපති/ලේකම් |
| 4 | සෑම පොදු වෙළඳපොලකම ව්‍යාපාර වර්ගය අනුව කලාප වෙන්කිරීමේ සැලැස්මක් පිළියෙල කර ඊට සභාවේ අනුමැතිය ලබා ගැනීම | ලංසු කැඳවීමට පෙර | සභාපති/ලේකම් |
| 5 | පැරණි කඩකාමර ඉවත් කර, එම ස්ථානයේ නව කඩ කාමර ඉදිකිරීමේ දී පැරණි බදුකරුවන්ගෙන් ඉල්ලීමක් වෙතොත් ප්‍රසම්පාදනයෙන් තොරව ඔවුන්ට අවස්ථාව සලසා දීම. | ලංසු කැඳවීමට පෙර | සභාපති/ලේකම් |
| 6 | ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කිරීම. | ලංසු ඉල්ලුම් පත්‍ර භාර ගැනීමට නියමිත දිනට අවම වශයෙන් දින 14 කට පෙර | සභාපති/ලේකම් |
| 7 | මුද්‍රා තබන ලද ලංසු භාර ගැනීමේ පෙට්ටිය සකස් කිරීම. | ලංසු ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම ආරම්භ කරන දිනට පෙර දින | ලේකම් |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය/ වගකීම |
|---|---|---|---|
| 8 | ආපසු ගෙවනු ලබන සහ නොගෙවනු ලබන ගාස්තු හා තැම්පත් අය කර ගෙන ලංසු ඉල්ලුම් පත්‍ර නිකුත්කිරීම. | දැන්වීමේ සඳහන් කළ ඉල්ලුම් පත්‍ර නිකුත්කිරීමේ අවසන් දින නියමිත වේලාවට පෙර. | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |
| 9 | ලංසු ඉල්ලුම් පත්‍ර භාර ගෙන ලංසු භාරගැනීමේ පෙට්ටියට දැමීම හෝ දැමීමට සැලැස්වීම. | දැන්වීමේ සඳහන් කළ ලංසු ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසන් දින නියමිත වේලාවට පෙර. | ලේකම් |
| 10 | ලංසු ඉල්ලුම් පත්‍ර විවෘත කිරීම සහ ඉල්ලුම් කළ ලංසු වටිනාකම් ප්‍රකාශයට පත් කිරීම. | ලංසු භාර ගන්නා අවසන් දිනයේ නියම කළ අවසන් වේලාවෙන් පසුව | ලංසු විවෘත කිරීමේ කමිටුව |
| 11 | ලංසු ඉල්ලුම් පත්‍ර ඇගයීම හා ඇගයීම් වාර්තාව ප්‍රසම්පාදන කමිටුවට යොමුකිරීම. | ලංසු විවෘත කළ දින සිට දින හතක් ඇතුළත | ලංසු ඇගයීම් කමිටුව |
| 12 | අවසන් නිර්දේශය මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවට යොමුකිරීම. | ලංසු ඇගයීම් කමිටු වාර්තාව ලැබුණු දින සිට දින හතක් ඇතුළත. | ප්‍රසම්පාදන කමිටුව |
| 13 | ලංසු ප්‍රදානය පිළිබඳ නිර්දේශය මහ සභාවට යොමු කිරීම. | මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමට පසුව එළඹෙන මහ සභා රැස්වීමට | සභාපති |
| 14 | ලංසු ප්‍රදානය පිළිබඳ අවසන් තීරණය ගැනීම. | මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමට පසුව එළඹෙන මහ සභා රැස්වීම් දින | මහ සභාව |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය/ වගකීම |
|---|---|---|---|
| 15 | ලංසු පිළිගත් බව සහ බදු කුලී ඇප ආරක්ෂණය සහ දේපළ ආරක්ෂණ ඇප තැන්පත් කර, ගිවිසුම් ගත වන ලෙස සාර්ථක ලංසුකරුට ලිඛිතව දැන්වීම. | මහ සභා රැස්වීමේ දින සිට දින හතක් ගත වීමට පෙර | ලේකම් |
| 16 | බදු කුලී ඇප ආරක්ෂණය සහ දේපළ ආරක්ෂණ ඇප තැන්පත් භාර ගැනීම සහ ඒ පිළිබඳව ලේකම්වරයා දැනුවත් කිරීම. | තැන්පත් භාර ගත් දිනම. | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |
| 17 | ගිවිසුම් කෙටුම්පත සභා ගත කිරීම හා ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම. | ලංසු පිළිගැනීම සඳහා අවසන් තීරණය ගත්, මහ සභාවට පසුව එන මහ සභාවේ දී. | සභාපති/ලේකම් |
| 18 | සාර්ථක ලංසුකරු සමඟ ගිවිසුම් ගත වීම. | මුදල් තැන්පත් කළ දින සිට දින හතක් ඇතුළත. | සභාපති සහ ලේකම් |
| 19 | පොදු මුද්‍රව තැබූ හා සාක්ෂි ලෙස සභාපති හා ලේකම් අත්සන් කරන ලද ගිවිසුම ගිවිසුම් ලේඛනයේ ලියාපදිංචි කර එහි ලියාපදිංචි අංකය ගිවිසුමේ සෑම පිටුවකම දැක්වීම. | ගිවිසුම් ගත වන දින. | ලේකම් |
| 20 | ගිවිසුමේ එක් පිටපතක් ලේකම් භාරය යටතේ ආරක්ෂිත සේප්පුවේ තැම්පත් කිරීම හා පිටපතක් බදු කරුට ලබා දීම. | ගිවිසුම් ගත වන දින. | ලේකම් |
| 21 | කඩ කාමරයෙහි යතුරු බදු ගැනුම්කරුට භාර දීම. | ගිවිසුම ක්‍රියාත්මක වන දිනයේ දී. | ලේකම් |

සටහන: 1. ලංසු කැඳවීමේ පුවත්පත් නිවේදනය මෙහි ඇමුණුම අංක 01 ට අනුකූලව පිළියෙළ කළ යුතුය.

2. ලංසු ඉල්ලුම් පත්‍රය සඳහා වන උපදෙස් මෙහි ඇමුණුම අංක 02 හි දැක්වෙන ආකාරයෙන් පිළියෙළ කළ යුතුය.
3. ලංසු ඉල්ලුම් පත්‍රය මෙහි ඇමුණුම අංක 03 හි දැක්වෙන ආකාරයෙන් පිළියෙළ කළ යුතුය.
4. ගිවිසුම් පත්‍රය මෙහි ඇමුණුම අංක 04 හි දැක්වෙන ආකාරයෙන් පිළියෙළ කළ යුතුය.
5. ලංසු ක්‍රියාවලියේ අවසානය පිළිබඳව සැලකිල්ලට ගනිමින් ලංසු ක්‍රියාවලියට අදාළ දින වකවානු තීරණය කිරීම සහ දැන්වීම් පළ කිරීමට වග බලා ගත යුතුය.

## 13.5 බද්ද පැවරීමට ඉල්ලීමක් ඉදිරිපත් වීම

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරිය/වගකීම |
|---|---|---|---|
| 1 | බදු අයිතිය පැවරීමට අදාළව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් වීම සම්බන්ධයෙන් සලකා බැලීම. | ගිවිසුම් ගත කාලයෙන් 1/3 ගත වූ පසු. | ලේකම් |
| 2 | බදු අයිතිය පැවරීමට අදාළව මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. | ඉල්ලීම ඉදිරිපත් වූ වහාම හා පැවරීමට අදාළ කරුණු තහවුරු වන අවස්ථාවේ දී. | සභාපති/ලේකම් |
| 3 | බදු අයිතිය සංශෝධනය කිරීමට අදාළව ගාස්තු අයකිරීම | බද්ද සංශෝධනය කර නව ගිවිසුමක් අත්සන් කරන දින. | ලේකම්/පෙරටු කාර්යාල නිලධාරී. |
| 4 | මහ සභා අනුමැතියෙන් හා ගාස්තු ගෙවීමෙන් පසු ගිවිසුම් ගත වීම. | මහ සභා තීරණය ලැබීමෙන් පසු ආසන්නම දිනයක්. | ලේකම්. |

## 13.6 වාරික මුදල් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී ක්‍රියාත්මක වීම

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | වාරික මුදල් ගෙවීම පැහැර හැර ඇති බව බදු ගැනුම්කරුට නිවේදනය කිරීම | වාරික මුදල් ගෙවීමට නියමිත දින පසු වූ වහාම | ලේකම් |
| 2 | නිවේදනයට අනුව වාරික මුදල් සහ ප්‍රමාද ගාස්තු ............(අයකරන ප්‍රමාණය) අය කර ගැනීම | නිවේදනය නිකුත් කළ දින සිට දින හතක් ඇතුළත | ලේකම් |
| 3 | නිවේදනයට අනුව වාරික මුදල් ගෙවීම තව දුරටත් පැහැර හරින්නේ නම්, කඩ කාමරය මුද්‍රා තබා වාරික මුදල් ගෙවන තෙක් මුද්‍රා විවෘත නොකරන බව බදු ගැනුම්කරුට දැන්වීම | නිවේදනය නිකුත් කළ දින සිට දින අටක් ගත වූ පසු | ලේකම් |
| 4 | නිවේදනයට අනුව නියමිත දිනට පෙර හිඟ මුදල් සහ ප්‍රමාද ගාස්තු ගෙවීම තව දුරටත් පැහැර හරින්නේ නම්, කඩ කාමරය තුළ ඇති බදු ගැනුම්කරු සතු දේපළ විකුණා අය විය යුතු මුදල් අය කර ගනු ලබන බවත්, කඩ කාමරයේ වසා බද්ද අවසන් කරන බවත් නිවේදනය කිරීම | මුල් නිවේදනය නිකුත් කළ දින සිට දින අටක් ගත වූ පසු | ලේකම් |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 5 | දැන්වීමට අනුව වාරික මුදල් සහ ප්‍රමාද ගාස්තු .........(ප්‍රමාණය) අය කර ගැනීමෙන් පසු කඩ කාමරයේ මුද්‍රා විවෘත කර දීම | වාරික මුදල් සහ ප්‍රමාද ගාස්තු ගෙවූ දින හෝ ඊට පසු දින | ලේකම් |
| 6 | දෙවන නිවේදනයෙන් පසුව ද හිඟ මුදල් සහ වාරික ගෙවීම පැහැර හරින්නේ නම්, අදාළ කඩ කාමරයේ ඇති බදු ගැනුම්කරු සතු දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය තීරණය කිරීම සහ ඒ පිළිබඳ ව බදු ගැනුම්කරුට නිවේදනය කිරීම | දෙවන නිවේදනය නිකුත් කළ දින සිට දින අටක් ගත වූ පසු | ලේකම් |
| 7 | අවස්ථාවෝචිත පරිදි හිඟ මුදල් ගෙවා වාස බද්ද අවසන් කිරීම නතර කර ගැනීමට බදු ගැනුම්කරුට අවස්ථාව දීම හෝ භාණ්ඩ වෙන්දේසි කර හිඟ මුදල් ආවරණය කර ගැනීම සහ කඩ කාමරය නැවත බදු දීම සඳහා ලංසු කැඳවීම | අවස්ථාවෝචිත පරිදි නියම කර ගත් දින නියමිත වේලාවට පෙර නැතහොත් නියමිත වේලාවේ දී | ලේකම් |
| 8 | හිඟ බදු මුදල් නොගෙවන්නේ නම් හා තැම්පත් මුදල් තුළින් ආවරණය කර ගත නොහැක්කේ නම් ගිවිසුම් නීතිය යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම | බදු ගිවිසුම් කාලය අවසන් වූ වහාම හෝ ගිවිසුම කඩ කර බද්ද අවසන් කළ අවස්ථාවක දී හා අවුරුදු 6 ඉක්ම වීමට පෙර. | ලේකම්/ විෂය භාර නිලධාරී. |